**ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම - 2013.**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ 27 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිසමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිසමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිසමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

2010 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ශේෂ ලෙස දක්වා ඇති ගිණුම් ශේෂ 03 ක එකතුව රු.491,244 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 26,067,297 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.29,099,096 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 3,031,799 කින් අඩුවී තිබුණු අතර නව නිපැයුම්කරුවන්ගේ දිරිගැන්වීමේ වියදම් රු.12,000,000 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ දිරි ගැන්වීමේ පනතේ 11(1) වගන්තිය අනුව කොමිසම විසින් ඉටුකළ යුතු පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(අ) පේටන්ට් බලපත්‍ර ලබා දීමට සුදුසු නව නිපැයුම් තෝරා පේටන්ට් බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ බුද්ධිමය දේපළ අයිතීන් උල්ලංඝනය වන විටදී ඔවුන්ගේ බුද්ධිමය දේපළ ආරක්ෂා කිරීම සඳහා නීතිමය සහය ලබාදීම.

(ඇ) පේටන්ට් බලපත්‍රය ඇපයට ගෙන රාජ්‍ය හෝ වෙනත් ආයතනවලින් ණය ලබා දීමට හැකිවන පරිදි වාණිජමය වටිනාකමකින් යුත් නව නිපැයුම් නිර්දේශ කිරීම.

(ඈ) දේශීය හා විදේශීය වෙළෙඳපොල පහසුකම් සොයා ගැනීමට උපකාර කිරීම.

(ඉ) නව නිපැයුම් සඳහා පර්යේෂණ සිදු කිරීමට හැකිවන පරිදි සැමට විවෘත පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම.

(ඊ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් පැවැත්වීම.

(උ) විශ්වවිද්‍යාලවල සහ විද්‍යාලවල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**4.2.1 නව නිපැයුම් වර්ධනය සඳහා දී ඇති ණය**

නව නිපැයුම්කරුවන් වශයෙන් හඳුනාගෙන ඇති පුද්ගලයන් 12 දෙනෙකුට නව නිපැයුම් ප්‍රවර්ධනය සඳහා 2008, 2009 වර්ෂවලදී ලබා දී තිබූ රු. 10,200,000 ක ණය මුදල සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නව නිපැයුම්කරුවන් සඳහා දී ඇති ණය සඳහා වාරික හා පොළී නිසි අයුරින් අය නොවීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට රු.9,534,220 ක් අයවිය යුතුව පැවති අතර, එම මුදල අයකර ගැනීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) නව නිපැයුම්කරුවන් 04 දෙනෙකුට ලබා දුන් රු. 3,700,000 ක ණය මුදල යොදවා කිසිදු නව නිපැයුමක් සිදුකර නොතිබුණි.

(ඇ) කොමිසම විසින් නව නිපැයුම්කරුවන් 04 දෙනෙකු වෙත ලබාදුන් රු. 3,500,000 ක ණය මුදල උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගෙන, නව නිපැයුම් වාණිජ මට්ටමෙන් නිෂ්පාදනය කර තිබුණි. එහෙත් ඔවුන් විසින් ණය ගෙවීම පැහැර හැරීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට රු. 3,416,800 ක් අයවිය යුතුව පැවතුණි.

**4.3 කාර්ය මණ්ඩල කළමනාකරණය**

2013 දෙසැම්බර් 31 දිනට විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 6ක් පැවති නමුත් එය පිරවීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

කොමිසමේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේ දී, 1979 අංක 53 දරන නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 11 වන වගන්තියේ දක්වා ඇති සියලුම කර්තව්‍යයන් ආවරණය වන පරිදි පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමසාරිස්ගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණය පරිපාලනය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) ගිණුම්කරණය